

# ඇලෙක්සැන්ඩ්‍රියාව ලොවින් සැඟවූ ප්‍රඥාවේ උල්පත

ඇලෙක්සැන්ඩ්‍රියාවේ ඓතිහාසික රාජකීය ග්‍රන්ථාගාරය අතීත ලෝකයේ තිබුනායැයි සැලකෙන විශාලතම පුස්තකාලය පමණක් නොව වදනේ පරිසමාප්ත අර්ථයෙන්ම සුවිශේෂී පුස්තකාලයක්ද වන බව විශ්ව සාහිත්‍යයේ සටහන්ව ඇත.

ග්‍රීක මිත්‍යා පුරාණෝක්ති ග්‍රන්ථවල ඇති පරිදි මෙම රාජකීය ග්‍රන්ථාගාරය පූජා කොට ඇත්තේ විද්‍යාවට, සාහිත්‍යයට හා කලාවට අධිගෘහිත දෙවඟනන් නව දෙනෙකුටය. කැලියෝප්, ක්ලියෝ, ඉයුටෝප්, ඉරේටෝ, මෙල්පොමීන්, පොලිහිම්නියා, ටර්ප්සිකෝ, තාලියා හා යුරානියා නම් වූ එම දෙ-වඟනන් පුරාතන ග්‍රීක සාහිත්‍යය හා සං-ස්කෘතිය තුළ දැනුමේ ප්‍රභවස්ථානයන් ලෙස හඳුන්වනු ලැබ තිබේ.

ටොලමි වංශිකයින්ගේ පීතෘ මූලික පාලන සමයක් යටතේ දියුනුවෙන් දියුනුවට පත් වූ මෙම සුවිශේෂී පුස්තකාලය, ක්‍රිස්තු පූර්ව තුන්සියවන සියවසේ සිට ක්‍රිස්තු පූර්ව තුන්වන සියවසේ රෝමානු පාලන තන්ත්‍රය දක්වාම විවිධ ශිෂ්‍යත්ව ප්‍රදානය කරමින් සාහිත්‍යයට විද්‍යාවට හා කලාවට අනුප-මේය සේවයක් සිදු කර ඇති බවද පොතපතෙහි සඳහන් වේ. පුරාණ ග්‍රීසියේ අති විශිෂ්ඨ දාර්ශනිකයින්, විද්‍යාඥයන්, කලාකරුවන් හා සාහිත්‍යධරයන් සිය අධ්‍යයන කටයුතු සඳහා එකල යොදාගනු ලැබූ ඇලෙක්සැන්ඩ්‍රියානු කෞතුකාගාරයේ (පුරාතන ලෝකයේ පැවති විශාලම ගවේෂණ මධ්‍යස්ථානය ) කොටසක් ලෙස පවත්වාගෙන යනු ලැබූ මෙම පුස්තකාලය, විශිෂ්ඨ නිර්මාණ රැසකින් පමණක් නොව, දේශන ශාලා, රැස්වීම් ශාලා, අවන් හල් සහ උද්‍යානවලින් පවා සමන්විතව තිබූ බවට සාක්ෂි සොයාගෙන තිබේ.

මහා ඇලෙක්සැන්ඩර් රජුගේ මැසිඩෝනියානු ජෙනරාල්වරයෙකු වන පළමුවෙනි ටොලමි විසින් ඊජිප්තුවේ පාලනය දිනාගත් ක්‍රිස්තු පූර්ව තුන්සියවන සියවසේදී නිර්මාණය කරන ලද මෙම සුවිසල් ග්‍රන්ථාගාරයෙහි ඇති සටහන් හා ග්‍රන්ථ බොහොමයක් පැපිරස් පත්‍රිකාවල ලියා තිබූ අතර සමහර නිර්මාණ හා ලේඛණ ආවර්ථිත ලිපි ලෙසද පවත්වාගෙන යනු ලැබ ඇත. තවද එම ලේඛණ හා ග්‍රන්ථ කොපමණක් තිබුනේදැයි සඳහන් කළ නොහැකි පමණටම ගණනින් විශාල වූ බව කියැවේ.

මෙම ග්‍රන්ථාගාරය පිළිබඳ ඇති සුප්‍රසිද්ධ මතයක් ලෙස සැළකෙන්නේ එය සංස්කෘතික දැනුම් සම්භාරයක සංහාරයක් සලකුණු කරමින් වරින් වර ගිනි තැබීම්, විනාශ කිරීම් වැනි විවිධ අභග්ගයන්ට ගොදුරු වෙමින් පැවති බවයි. ක්‍රිස්තු පූර්ව 48 ජුලියස් සීසර් විසින්ද ක්‍රිස්තු වර්ශ 270දී රෝමානු අධිරාජයෙකු වන ඔරිලියන් විසින්ද ක්‍රිස්තු වර්ෂ 391දී තියෝෆිලස් පාප් වරයා විසින්ද සිදු කරන ලද පහර දීම් සහ ගිනි තැබීම් පිළිබඳ ග්‍රීක ඉතිහාස ලේඛන වල සඳහන් වේ. පසු කාලීනව තුන්වන ටොලමි විසින් නිමවන ලද සිලේපියම් ආරාමයේ, ඇලෙක්සැන්ඩ්‍රියානු ග්‍රන්ථාගාරය නමින් කුඩා පුස්තකාලයක් පවත්වාගෙන යාම සඳහා එවක පඬිවරුන් උනන්දු වී ඇත. ක්‍රිස්තු වර්ෂ පස්වන සියවසේ සිටි ක්‍රිස්තියානි ආයතන පුරා විද්‍යාඥයෙකු වන කොන්ස්තන්තිනෝපලයේ සොක්‍රටීස්ට අනුව නම්




සිලේපියම් ආරාමයේ ගොඩ නැගුනු එම ග්‍රන්ථාගාරයද තියෝෆිලස් නම් වූ කොප්ටික් පාප්-වරයා විසින් ක්‍රිස්තු වර්ෂ 391දීම දවා විනාශ කොට ඇත.

ඉහත කරුණු එසේ වුවද, මෙම ග්‍රන්ථාගාරය පිළිබඳ ඉතිහාස කතා හා ජනප්‍රවාද බොහොමයක්ද පවතින අතර එය හුදෙක් ඊජිප්තුවේ එවකට පැවති සශ්‍රීකත්වය දක්වන්නට නිමැවූ ග්‍රන්ථාගාරයක් වන්නටද හැකි බව සමහර මූලාශ මගින් දැක්වේ. තවත් මූලාශ්‍රවලින් හෙළිවන පරිදි මෙම ග්‍රන්ථාගාරයට ටොලමි අධිරාජයෙකු වූ ෆිලඩෙල්ෆස් (ක්‍රි.පූ.309*246) විසින් ආවර්තිත ලිපි හා පුස්තක 500,000ක් සංස්කරණය කිරීම සඳහා ඉදිරිපත් කර තිබේ. විවාහෝත්සවයේදී රෝමානු ජෙනරාල්වරයෙකු වූ මාක් ඇන්තනී, පුරාණ ඊජිප්තුවේ අවසාන සක්‍රීය පාරාඕවරිය වූ ක්ලියෝපැට්‍රාට ත්‍යාගයක් වශයෙන් ග්‍රීසියේ පර්ගමම් (බසඉර්‍රහ ද‍ෙ ඡැරට්පමප) ග්‍රන්ථාගාරයෙන් ලබාගත් ආවර්තිත ලේඛන හා පුස්තක 200,000ක් ඇලෙක්සැන්ඩ්‍රියාවේ ග්‍රන්ථාගාරය වෙත ප්‍රදානය කොට ඇති බවද සඳහන් වේ.

පර්යේෂණ ආයතනයක් ලෙස මෙම ග්‍රන්ථාගාරය තුළ ගණිතය, තාරකා විද්‍යාව, ස්වභාව විද්‍යාවන්, භූ විද්‍යාත්මක පර්යේෂණ හා දර්ශනය වැනි අංශයන් පිළිබඳ ලියැවුනු විවිද ලේඛණ පමණක් නොව විවිධ වූ මති මතාන්තර විචාර විවාද පව ලියැවුනු පැපිරස් පත්‍රිකා තිබෙන්නට ඇතැයි විශ්වාස කෙරේ. තවද, ඒවායෙහි සංඛ්‍යාත්මක අගයක් ගැන කිසිදු මූලාශ්‍රයක පැහැදිලි සඳනක් නැත.

ඇලෙක්සැන්ඩ්‍රියාවට හිමි වූ ඒ සුවිශේෂී ඥාණ සම්භාරය, රාජ්‍ය බලය හා ත්‍රස්තවාදී ප්‍රහාරයන් හේතුවෙන් විවිද පුද්ගලයින්ගේ ආත්මාර්ථකාමී හැඟීම් හා බල තන්හාවන් උදෙසා දැවී අළු වී මේ වනවිටත් සියවස් ගණනාවක් ගතවී හමාරය. එය අද ලෝකයේ ඥාණ ගවේශකයින්ගේ අභාග්‍යය නොවේනම් වෙන කුමක්ද?




පොත පත දෙසට හෙලන
විමසුම් ඇස
**“සාහිත්‍ය සම්භාෂණ”**
ඕස්ට්‍රේලියා වාසී ශ්‍රී ලාංකික ලේඛක ලේඛිකාවන්ගේ නිර්මාණ හඳුන්වා දෙන ජගත් ජේ එදිරිසිංහ සමග දිනේෂා දිල්රු-ක්ෂි විජේසූරිය ඉදිරිපත් කරන "සාහිත්‍ය සම්භාෂණ" එස්බීඑස් ගුවන් විදුලියේ සිංහල සේවයෙන් සෑම මසකම අවසන් අඟහරුවාදා දහවල් 11 ට FM93.1.
අන්තර්ජාලයෙන් ඇසීමට
http://www.sbs.com.au/yourlanguage/sinhalese/

MATHU LIYANAGE’S NEW BOOK

**SEXUAL AND DOMESTIC VIOLENCE: Its time...**

**IS Out NOW**






It is a collection of recently published articles in two Australian community newspapers published in Melbourne – *Pahana* and *Sannasa* and distributed across the country and overseas; and in Sri Lanka’s national newspapers, *The Daily News* and *The Island*.

Sexual and domestic violence has become a burning social issue, especially in developing and poor countries despite attempts by governments and other relevant agencies to reduce or contain the problem. The number of cases has unfortunately risen sky high, making it a highly dangerous social threat, putting vulnerable women and children at great risk. The articles on this issue have been given pride of place in the book to draw the attention of public-spirited citizens in the communities.

Other articles such as *Mandela: A fountain of inspiration, love and compassion*, *Modi roars*. and *The rise of an erudite writer* are interesting, stimulating and inspiring and will suit readers of all ages.

The author discusses the theory of Magical Realism that influenced his writing of short stories, citing the story of *Hello Dolly*, which is included in this book, as a good example.

Why not grab a copy of this book?

Please contact the author by post (7 St Marys Street, South Australia, SA 5042) or by email mathu27@yahoo.com The book is priced at $ 12.00 plus $1.50 for postage and handling. Payment may be made by cheque, money order or by direct deposit to Commonwealth Bank of Australia, BSB 067 167 A/c No 13006342
(This book is not available with booksellers)

සුභාවිත ගීතයේ අන්තර්ජාල නවාතැන - තිසර **www.thisara.com**